# ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඩලීම සඳහා නීති ප්‍රතිසංස්කරණ

3 වන කොටස

## ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 නොවැම්බර්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව

දුරකථන: +9411 2081384, +94112081385, +94112081386

ෆැක්ස්: +9411 2081388

වෙබ්: www.cpalanka.org

ඊමේල්: info@cpalanka.org

ෆේස්බුක්: www.facebook.com/cpasl

ට්විටර්: @cpasl

# පිළිගැනීම්

මෙම වාර්තාව පර්යේෂණය කර ලියා ඇත්තේ ඉන්ෂිරා ෆාලික් සහ කුෂ්මිලා රණසිංහ විසිනි. මෙකී වාර්තාවෙහි මුල් කෙටුම්පත් සම්බන්ධයෙන් ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, භවානි ෆොන්සේකා, කයාති වික්‍රමනායක සහ නිවේදා ජයසීලන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදි. වාර්තාව සංස්කරණය කිරීම පසන් ජයසිංහ විසින් කරන ලද අතර මෙහි පිටු සැකසුම අයුධ්‍යා ගජනායක විසින් සිදු කරන ලදි. මෙම වාර්තාව සඳහා අවැසි තොරතුරු සහ දැනුම බෙදාගත් අර්මිසා ටීගල් දැක්වූ සහාය සම්බනධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය කෘතඥ පිරිනමනු ලැබේ.

# අන්තර්ගතය

**පිළිගැනීම්** ........ **2**

**අන්තර්ගතය** ........ **3**

**හැඳින්වීම** ........ **4**

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම ........ 4

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ තත්වය ........ 5

ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය යටතේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම ට දඬුවම් කළ හැකිද? ........ 7

**විවිධ කලාපයන්හි ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ තුලනාත්මක නීති තත්වයන්** ........ **10**

එක්සත් රාජධානිය ........ 10

ඉන්දියාව ........ 12

වෙනත් රටවල අධිකරණ බලයන් පිළිබඳ තත්වය ........ 14

**නිර්දේශ** ........ **16**

නීති ප්‍රතිසංස්කරණ ........ 17

ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ........ 17

# හැඳින්වීම

මෙම වාර්තාව ඔස්සේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් (Female Genital Mutilation – FGM) පවතින තත්වයට අදාල නීති ප්‍රතිසංස්කරණ අවැසි ක්ෂේත්‍ර පිළිබඳ ගවේෂණය කරනු ලබයි. එය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් පවතින භාවිතය පිළිබඳ සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිපූර්ණ විශ්ලේෂණයක් නොවන අතර පවතින අපරාධ නීතියේ අඩු ලුහුඬුකම් හඳුනා ගැනීමේ විශේෂ අරමුණ ඇතිව සිදු කරන ලද පර්යේෂණයකි. මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ ඔස්සේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු ආමන්ත්‍රණය කරනු ලබන අතර එකී ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාර්ථක නෛතික ප්‍රතිසංස්කරණ වලට පිටුවහලක් වන ප්‍රතිපත්තිමය නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි.

මෙම වාර්තාව ලිංගික හිංසනය මැඩපැවැත්වීම සඳහා අවැසි නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන ලිපි මාලාවක III වන කොටසයි. පළමුවන කොටස ඔස්සේ ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වන්නා වූ නීති විමර්ශනය කිරීම සහ මෙම ක්ෂේත්‍රයෙහි නීති ප්‍රතිසංස්කරණ මන්දගාමී වීමට බලපාන ලද හේතූන් කවරේද යන්න විමසන ලදි. මෙකී ලිපි මාලාවෙහි II වන සහ IV වන කොටස් මඟින් පිළිවෙලින් මාර්ගගත ලිංගික හිංසනය සහ අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර සිදු කිරීම අපරාධනීය වරදවල් වශයෙන් සංස්ථාපනය සඳහා අවැසි නිශ්චිත නීති හඳුන්වා දීමේ අවශ්‍යතාව විමර්ෂණයට ලක් කරනු ලබයි.

# ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම වූ කලී ස්ත්‍රී ප්‍රජනක අවයව ඡේදනය කිරීම වශයෙන් ද හඳුන්වනු ලබන අතර ඊට අන්තර්ගත වන්නේ, *"බාහිර කාන්තා ලිංගේන්ද්‍රිය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම හෝ වෛද්‍ය නොවන හේතූන් මත කාන්තා ප්‍රජනක අවයව වලට සිදු කරන වෙනත් තුවාල"* ආදිය වේ.[1] ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම වූ කලී ගැහැණු ළමයින්ගේ හා කාන්තාවන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස ජාත්‍යන්තරව පිළිගෙන ඇති අතර ලෝක සෞඛ්‍ය සංවිධානය (World Health Organisation-WHO) විසින් එය කාණ්ඩ හතරකට වර්ග කරනු ලබයි:[2]

- පළමු වර්ගය: ක්ලිටොරිඩෙක්ටොමී - භගමණිය සහ/හෝ භගමණිය ආශ්‍රිත පෙරසම අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම
- දෙවන වර්ගය: ඡේදනය කිරීම - භගමණිය සහ බාහිර සහ අභ්‍යන්තර යෝනි තොල් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම.
- තෙවන වර්ගය: බාහිර සහ අභ්‍යන්තර යෝනි තොල් ඡේදනය කර යෝනි විවරය පටු කිරීම පිණිස නැවත සම ආවරණය කර සකස් කිරීම.
- සිව්වන වර්ගය: වෙනත් - වෛද්‍ය නොවන අරමුණු සඳහා කාන්තා ලිංගේන්ද්‍රියට සිදුවන අනෙකුත් සියලුම හානිකර ක්‍රියා පටිපාටි, උදාහරණ. සම විදීම, සිදුරු කිරීම, කැපීම, සීරීම සහ පිළිස්සීම හෙවත් අග්නිකර්මය

[1] ලෝක සෞඛ්‍ය සංවිධානය, 'කරුණු පත්‍රිකාව: ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීම', WHO ප්‍රකාශන ජිනීවා, 2018 ජනවාරි, ලබා ගත හැකි: https://www.who.int/en/news-room/fact-sheets/detail/female-genital-mutilation
[2] ඉහත එම.

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් වලට භාජනය වූ කාන්තාවන් සහ ගැහැණු ළමයින් දිගු කාලීන ශාරීරික හා මානසික සෞඛ්‍ය සංකූලතාවන්ගෙන් පීඩා විඳිය හැකි අතර එය දරු ප්‍රසූතියක දී උද්ගතවිය හැකි වේදනාවකට සහ අතිශය දරුණු අවධානමකට මුහුණ දීමට සිදු වීම වැනි බොහෝ ප්‍රතිවිපාකවලට ද හේතුපාදක විය හැකිය.[3] ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් තුළින් කිසිදු ආකාරයක වෛද්‍යමය වශයෙන් වූ ප්‍රතිලාභ කිසිවක් නොමැති අතර ඇතැම් ජනකොටස් විසින් සියවස් ගණනාවක් තිස්සේ සමාජයේ ගැඹුරින් මුල්බැස ඇති ආගමික හා සංස්කෘතික හේතූන් මත මෙම පරිචය පදනම්ව පවතී.[4] මෙම ක්‍රියාව අනුමත කරන්නා වූ තැනැත්තන් විසින් විවිධාකාර සාධාරණීකරණයන් ඉදිරිපත් කරන අතර, එය ස්ත්‍රීත්වයට පිවිසීම සඳහා වන චාරිත්‍රයක් වශයෙන් හෝ චර්මඡේදනය කරන ලද කාන්තාවන් ඔවුන්ගේ ලිංගික ආශාවන් විසින් පාලනය නොකිරීම නිසා වෛවාහක පාර්ශවයට එරෙහි ද්‍රෝහී ක්‍රියාවන්හි යෙදීමට හැකියාවක් නොමැති තත්වයක් ඇති කිරීම වැනි තර්කයන් ඉදිරිපත් කරනු ලැබේ.[5] මෙහිදී, සමහර ප්‍රජාවන් විසින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම හුදෙක් ආගමික අවශ්‍යතාවයක් මත පදනම්ව සිදු කෙරෙන බව සාධාරණීකරණය කිරීමට උත්සාහ කළද, ඒ සම්බන්ධයෙන් පවතින පර්යේෂණවලින් විද්‍යමාන වන්නේ එකී ආගම් බොහොමයකට පෙර සිටම මෙම ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය පවතින බවයි.[6]

මේ අනුව, ආගමික ග්‍රන්ථ හෝ පිළිපැදීම වත් පිළිවෙත් මඟින් මෙකී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය එපරිදිම පත්වාගෙන යාමට පදනම් සාධකයක් වශයෙන් තවදුරටත් නොපවතී.[7] එය හුදෙක් සමාජීය වශයෙන් ගැහැණු ළමයින්ගේ සහ කාන්තාවන්ගේ ශරීර පාලනය කිරීම සහ ඔවුන්ගේ ලිංගික ස්වායත්තභාවය කෙරෙහි මූලික කරගෙන සිදුවන්නක් බව පෙනේ.[8] ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය වූ කලී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් ගැඹුරින් මුල් බැස ඇති අසමානතාවයේ පිළිබිඹුවක් වන අතර එතුළින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට සහ නිසි ගුණත්වයෙන් යුත් ඔවුන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට බාධාකාරී ලෙස බලපානු ලැබේ.[9]

## ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ තත්වය

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නම් වූ තත්වයෙහි භාවිතයට සංස්කෘතිකමය සුවිශේෂිත සම්බන්ධයක්[10] පවතින අතර; ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඒ සම්බන්ධයෙන් *'කට්නා'* සහ *'සුන්නත්'* යන යෙදුම් භාවිතා වේ.[11] ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නම් වූ පරිචය ක්‍රියාත්මක වන්නේ සමාජ සම්මුතිය සමඟ බැඳී ඇත්තා වූත් කාන්තාවකගේ ජීවිතයේ සිදුවන විචක්ෂණ වූත් සහ පෞද්ගලික වූත් සිදුවීමක් වශයෙන්

---

3 ලෝක සෞඛ්‍ය සංවිධානය, 'කාන්තා ප්‍රජනක අවයව විකෘති කිරීම මුලිනුපුටා දැමීම: බහු ආයතනික ඒකාබද්ධ ප්‍රකාශයක්', 2008, 1-39 පි. https://www.who.int/reproductivehealth/publications/fgm/9789241596442/en/

4 ඉහත එම.

5 බෙන් මැතිව්ස්, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම: ඕස්ට්‍රේලියානු නීතිය, ප්‍රතිපත්ති සහ වෛද්‍යවරුන්ට ඇති ප්‍රායෝගික අභියෝග'' මෙඩ් ජේ ඔස්ට් 2011; 194 (3), https://www.mja.com.au/journal/2011/194/3/female-genital-mutilation-australianlaw-policy-and-practical-challenges-doctors

6 'නීතිය සහ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම', තොම්සන් රොයිටර්ස් පදනම, 2018 සැප්තැම්බර් 12
https://www.28toomany.org/static/media/uploads/Law%20Reports/the_law_and_fgm_v1_(september_2018).pdf

7 ඉහත එම, බෙන් මැතිව්ස්, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම: ඕස්ට්‍රේලියානු නීතිය, ප්‍රතිපත්ති සහ වෛද්‍යවරුන්ට ඇති ප්‍රායෝගික අභියෝග''

8 ඉහත එම.

9 ' ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ ප්‍රභවයන්' (එක්සත් ජාතීන්ගේ කාන්තාවන්),
https://www.who.int/reproductivehealth/publications/fgm/9789241596442/en/

10 හෝප් ලුවිස්, 'ඉරුඅා සහ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම: ස්ත්‍රීවාදී මානව හිමිකම් කතිකාව සහ සංස්කෘතික බෙදීම' හාවඩ් මානව හිමිකම් සඟරාව වෙළුම 1, 1995, පි. 5
https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=1080248

11 සයිනබ් ඉබ්‍රාහිම් සහ අර්මිසා ටෙගල්, ශ්‍රී ලංකාවේ කාන්තා ලිංගේන්ද්‍රිය කැපීම පිළිබඳව අවබෝධ කර ගැනීම, ශ්‍රී ලංකාවේ පවුල් සැලසුම් සංගමය, 2019, පි. 7
http://www.fpasrilanka.org/sites/default/files/towards_understanding_female_genital_cutting_in_sri_lanka.pdf

රහසිගත[12] ක්‍රියාවලියක් ලෙසිනි.[13] මෙකී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය වටා ඇති රහස්‍යභාවය ද සමඟින්, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වයන් සෘජුවම ආමන්ත්‍රණය කිරීමට හැකියාව ඇති නීති ප්‍රමාණවත් තරම් නොමැති තත්වයක් තිබේ. කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන විවිධාකාර වූ කණ්ඩායම් විසින් ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වයන් සෘජුවම ආමන්ත්‍රණය කිරීම පිණිස නෛතිකමය සහ ප්‍රතිපත්ති හඳුන්වාදීමේ හා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව නිරන්තරයෙන් ඉස්මතු කර ඇති නමුත්, එකී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව තහනම් කිරීමට ඵලදායී ලෙස පියවර ගෙන නොමැත.[14]

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පොදුවේ ප්‍රසිද්ධියට පත්කල නිල සංඛ්‍යා දත්ත ලබා ගත හැකි ජාතික මට්ටමේ ඇස්තමේන්තුගත තොරතුරු[15] නොමැති පසුබිමක, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව දශක ගණනාවක් තිස්සේ භාවිතයේ පවතින බවට වන මතය තහවුරු කර දැක්වීම සඳහා විවිධ නිල නොවන[16] අවිධිමත් දත්ත තොරතුරු[17] භාවිතා කර ඇත.[18] මෙම වාර්තාවලින් විද්‍යමාන වන්නේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම ශ්‍රී ලංකාවේ මූවර්, මැලේ සහ ඩාවුඩි බෝරා යන ජනවාර්ගික ප්‍රජාවන් තුළ ක්‍රියාත්මක වන බවයි.[19] එමෙන්ම, සමස්ත ලංකාවේ ජමියාතුල් උලෙමා (ACJU) සංවිධානය විසින් 2008 දී නිකුත් කරන ලද ෆට්වා මගින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම අනිවාර්ය හා නිර්දේශිත භාවිතයක් ලෙස සලකනු ලැබීය.[20] මෙම තීන්දුව සඳහා හේතු පාදක වූ කරුණු අතර ආගමික සාධාරණීකරණයන් මෙන්ම පිරිසිදුකම යන්න ද පවතී.[21] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ජන ප්‍රජාවන් තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳව විවිධ මත ප්‍රකාශ වන අතර සමහර පූජකයන් මෙම ක්‍රියාව ප්‍රවර්ධනය කරන අතරම එකී ක්‍රියාවට විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලබන අයද සිටිති.[22]

---

12 ක්‍රිස් තෝමස්, 'චර්මච්ඡේදනය සමඟ සංවාදː ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම', රෝර් මීඩියා, 2020 පෙබරවාරි 27, https://roar.media/english/life/in-the-know/conversations-with-a-circumciser-female-genital-mutilation-srilanka

13 සාවිත්‍රි ගුණසේකර, 'දකුණු ආසියාවේ රටවල් තුනක පවතින හානිකර සාම්ප්‍රදායික පිළිවෙත්ː සංස්කෘතිය, මානව හිමිකම් සහ කාන්තාවන්ට එරෙහි හිංසනය', *UNESCAP යුනෙස්කැප් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සංවර්ධනය, 2012, සංවාද පත්‍රිකා අංක 21* හිː https://www.unescap.org/resources/harmful-traditional-practices-three-countries-south-asia-culturehuman-rights-and-violence

14 වර්ෂ 2017 දී, ක්‍රියාකාරිනියක වන ශ්‍රීන් සරූර් විසින් ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුවෙන් ඉල්ලා සිටින ලද්දේ රජය විසින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම අපරාධයක් වශයෙන් සංස්ථාපනය කිරීමට කටයුතු කළ යුතු බවයි. බලන්න 'ශ්‍රී ලංකාව කාන්තා ලිංගේන්ද්‍රිය කැපීම අපරාධයක් වශයෙන් සංස්ථාපනය කළ යුතු බව මෙම ක්‍රියාකාරිනිය පවසයි. ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 61',ː *ශ්‍රී ලංකාව පිළිබඳ ලුහුඬු සටහන,* 2017 ජූලි 9, https://srilankabrief.org/2017/06/govt-should-criminalisethe-practice-of-female-genital-cut-in-sri-lanka-activists-tell-cescr-61/

15 මෙම ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව ශ්‍රී ලංකාවේ සිදු වීම ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය සහ මහජන සෞඛ්‍ය විශේෂඥවරියක වන සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලෙ මහත්මිය පුදුමයට පත් වූ අතර, ඇය ප්‍රකාශ කරන ලද්දේ "එකී ක්‍රියාව නීතියෙන් නියාමනය කර නොමැති බැවින් එහි ව්‍යාප්තිය පිළිබඳව "අධ්‍යයන හිඟයක් සහ මහජන දත්ත තොරතුරු නොමැත"යනුවෙනි. අයිෂා නසීම්, "කුඩා තහඩු කතුරː ශ්‍රී ලංකාවේ කාන්තා ලිංගේන්ද්‍රිය කැපීමේ දීර්ඝ කාලීන බලපෑම්", රෝර් මීඩියා, 2018 ජනවාරි 10) බලන්න https://roar.media/english/life/in-the-know/minor-snips-the-long-lasting-effectsof-female-genital-cutting-in-sri-lanka

16 ඉහත එම, තෝමස්, 'චර්මච්ඡේදනය සමඟ සංවාද', රෝර් මීඩියා.

17 ඉහත එම, ලෝක සෞඛ්‍ය සංවිධානය, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම මුලිනුපුටා දැමීම', පි. 42 යි.

18 සයිනබ් ඉබ්‍රාහිම් සහ එර්මිසා ටීගල්, 'ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමː එය කිසි විටෙකත් 'හුදු සිදුරු කිරීමක් නොවේ', අල් ජසීරා, 2017 දෙසැම්බර් 25, https://www.aljazeera.com/indepth/opinion/fgm-sri-lanka-nick-171218122855118.html

19 ඉහත එම.

20 ඉහත එම. ආනිෂ් කුට්ටිලන්, 'කාන්තා චර්මච්ඡේදනය, ලිංගික විකෘති කිරීම සහ යල් පැන ගිය ශ්‍රී ලාංකික භාවිතයක යථාර්ථය', *Pulse.lk*, 2018 සැප්තැම්බර් 26, මෙයද බලන්නː http://www.pulse.lk/everythingelse/female-circumcisiongenital-mutilation-an-outdated-sri-lankan-practice/

21 ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ලිංගේන්ද්‍රිය කැපීම අවබෝධ කර ගැනීම සඳහා ඊබ්‍රාහිම් සහ ටීගල්, පි. 7.

22 ඊබ්‍රාහිම් සහ ටීගල්, 'ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම', අල් ජසීරා. ආර්. සේනානායක, 'ශ්‍රී ලංකාව-සංස්කෘතියː දියණියන් චර්මඡේදනය කර ඇති ආකාරය මවුවරුන් අත්දකී', අන්තර් පුවත්පත් සේවය, 1996 අගෝස්තු 19, http://www.ipsnews.net/1996/08/sri-lanka-culture-mothers-watch-as-daughters-arecircumcised/

ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිවලින් බහුතරයක් චාරිත්‍රයක් ලෙස සිදු කරනු ලබන අතර, කිසිදු වෛද්‍ය පුහුණුවක් නොමැති[23] *'ඔස්ති මාමී'* (බාබර් කාන්තාව) නමින් හඳුන්වනු ලබන පුද්ගලයෙකු විසින් පරම්පරා ගණනාවක් පුරා සිදු කරනු ලබන අතර, ලියාපදිංචි වූ හෝ ලියාපදිංචි නොවූ වෛද්‍ය වෘත්තිකයන් විසින් සිදු කරනු ලබන ක්‍රියා පටිපාටි කිහිපයක් ද දක්නට ලැබේ.[24] ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්වචනය කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම වූ කලී I වන සහ IV වන කාණ්ඩවලට අයත් වේ (පිළිවෙලින් කාන්තා ලිංගේන්ද්‍රියෙහි භගමණි ඡේදනය සහ වෙනත් හානිකර ක්‍රියා පටිපාටි).[25] මේ සම්බන්ධයෙන් පවතින සාක්ෂි ඔස්සේ විමසීමේ දී, උපතින් පසු සති හතරක් හෝ පහක්[26] වයසැති ළදරුවන් මෙන්ම[27] තරුණ වියේ ගැහැණු ළමයින්ද[28] මෙම ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචයට භාජනය වේ. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචයට භාජනය වීමේ අත්දැකීම්වල වේදනාව හා කම්පනය ද, පසුකාලීන පුද්ගල සම්බන්ධතාවන් පැවැත්වීමේ දී උද්ගතවන දුෂ්කරතාවන්ට මුහුණ දීම සහ වැඩිහිටියන් වශයෙන් ලබන ලිංගික සතුට අඩු වීම වැනි දිගු කාලීන ප්‍රතිවිපාක ද මෙකී පැහැදිලී කිරීම් මඟින් විද්‍යමාන කෙරේ.[29]

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය යල්පැනගිය ක්‍රියාවකි. ළදරුවන්ට සහ එවැනි ක්‍රියාවන් සඳහා අවබෝධයක් හෝ දැනුමක් සහිතව ස්වකීය කැමැත්ත ප්‍රකාශ කිරීමට නොහැකි වූ ළමුන් මත පනවනු ලබන ක්‍රියාවක් වශයෙන් ගත් කල එය ළමා අපයෝජනයට සමාන වේ. එමනිසා, මෙකී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය අවසන් කිරීම සහතික කිරීම සඳහා නීතිය නිසි පරිදි ප්‍රතිචාර දැක්වීම අතිශයින්ම වැදගත් වේ.

## ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය යටතේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම ට දඬුවම් කළ හැකිද?

ශ්‍රී ලංකාවේ දේශීය නීති පද්ධතිය තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය සම්බන්ධයෙන් ඇති නෛතික විධිවිධාන අනුගමනය කිරීම සීමිත තත්වයක ඇත. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ, ළමයින් කෲරත්වයට භාජනය කිරීම[30] සහ බරපතල තුවාල සිදු කිරීම[31] නම් වූ වරදවල් යටතේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වන සිද්ධීන් අන්තර්ගත කිරීම පිණිස පුළුල්ව අර්ථ දැක්විය හැකිය. වර්ෂ 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පනතේ 39 වන වගන්තිය යටතේ "ළමා අපයෝජනය" යන්නෙහි අර්ථය තුළට ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව ඇතුළත් කිරීම ද කළ හැකිය.[32] ළමයින් ආරක්ෂා කිරීම සම්බන්ධ ගැටළු අධීක්ෂණය කිරීම, උපදෙස් දීම, උපදේශනය කිරීම සහ

---

23 විමුක්ති ප්‍රනාන්දු, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම: කැළැල් සහිත ජීවිත සන්තාපය', සන්ඩේ ඔබ්සර්වර්, 2018 ඔක්තෝබර් 21 http://www.sundayobserver.lk/2018/10/21/news-features/female-genital-mutilation-lifetime-scarred-agony

24 ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ 77 වන සැසිවාරය, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන පස්වන හා හයවන ඒකාබද්ධ කාලානුරූපී වාර්තා පරීක්ෂා කිරීම සඳහා මන්නාරම් කාන්තා සංවර්ධන සම්මේලනයේ වාර්තාව ශ්‍රීන් සරූර්, 2017 දෙසැම්බර්, පි. 4 https://tbinternet.ohchr.org/Treaties/CRC/Shared%20Documents/LKA/INT_CRC_NGO_LKA_29835_E.pdf

25 ඉහත එම.

26 ඉහත එම, ආර් සේනානායක, 'ශ්‍රී ලංකාව-', *අන්තර් පුවත්පත් සේවය.*

27 ඉහත එම, සාවිත්‍රි ගුණසේකර, 'දකුණු ආසියාවේ රටවල් තුනක හානිකර සාම්ප්‍රදායික පිළිවෙත්: සංස්කෘතිය, මානව හිමිකම් සහ කාන්තාවන්ට එරෙහි හිංසනය'.

28 ඉහත එම.

29 ශ්‍රී ලංකාවේ කාන්තා ලිංගේන්ද්‍රිය ඡේදනය කිරීමේ ( Female Genital Cutting - FGC) පරිචය පිළිබඳ ඉදිරිපත් කිරීම (2017 ඔක්තෝබර් 5)

30 වයස අවුරුදු දහඅටට අඩු යම් තැනැත්තෙකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂකත්වය දරා සිටිමින්, ඒ තැනැත්තාට වේදනාවක් හෝ ඔහුගේ සෞඛ්‍යයට හානියක් සිදුවිය හැකි ආකාරයට (ඇස් පෙනීමට හෝ කන් ඇසීමට හෝ ශරීරයේ අවයවයකට හෝ ඉන්ද්‍රියකට සිදු කරන යම් තුවාලයක් හෝ, ඇස් පෙනීමෙහි ලා හෝ කන් ඇසීමෙහි ලා සිදු කරන ලද යම් හානියක් හෝ මානසික ව්‍යාකුලතාවයක් අතුළුව, ඕනෑකමින්ම, ඒ තැනැත්තාට අඩන්තේට්ටම් කරන, හිංසා කරන, නොසලකා හරින හෝ අතරමං කරන හෝ ඒ තැනැත්තාට අඩන්තේට්ටම් කරනු ලැබීමට, හිංසා කරනු ලැබීමට, නොසලකා හරිනු ලැබීමට හෝ අතරමං කරනු ලැබීමට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙක් ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද සිදු කරන්නේය." ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයෙහි 308 අ (1), බලන්න.

31 ඉහත එම. 311 වන වගන්තිය.

32 ළමයින් කෲරත්වයට භාජනය කිරීම පිළිබඳ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කිරීම හෝ නොකර හැරීම මෙම අර්ථ නිරූපණයට ඇතුළත් වේ.

නිර්දේශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ (National Child Protection Authority-NCPA) කාර්ය කර්තව්‍යයන් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පර්චයට එරෙහිව යොදා ගත හැකිය.[33]

සත්‍ය වශයෙන්ම, වර්ෂ 2017 දී කාන්තා ක්‍රියාකාරීන් විසින් සම්පාදනය කරන ලද ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ වාර්තාවක් ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, මානව හිමිකම් කොමිසම (Human Rights Commission-HRC) සහ පාර්ලිමේන්තු කමිටු කිහිපයකට ඉදිරිපත් කරන ලදි.[34] මෙම වාර්තාවට ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වන පරිචය පිළිබඳ පුද්ගල සාක්ෂි 15 ක් ඇතුළත් විය.[35] ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම තහනම් කිරීමේ නීති හඳුන්වා දීමේ හා ඒවා ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ද එතුළින් පෙන්වා දුන් අතර, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වන පරිචය පිළිබඳව ප්‍රජාවන් තුළ ප්‍රතිවිරුද්ධ අදහස් ප්‍රකාශ කිරීම සහ සාමූහික තීරණ ගැනීමේදී බලපෑම් කිරීමට එමගින් අදහස් කරන ලදි.[36]

එකී වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, වර්ෂ 2018 මුල් භාගයේදී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට භාජනය වූ කාන්තාවන් සහ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ සහභාගීත්වයෙන් කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුවේ (Parliamentary Sectoral Oversight Committee on Women and Gender-PSOCWG) රහස්‍ය විමර්ෂණයක් පැවැත්විණි. මෙකී විමර්ෂණය තුළින් ඉස්මතු වූ තොරතුරු පදනම් කරගනිමින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර එමගින්, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම හෝ ස්ත්‍රී චර්ම ඡේදනය සම්බන්ධයෙන් වන කිසිදු ක්‍රියාවකට සම්බන්ධ නොවී සිටීමට අදාල උපදෙස් වෛද්‍ය වෘත්තිකයන් වෙත ලබා දෙන ලදි.[37] එකී චක්‍රලේඛනය මඟින් පෙන්වා දෙන ලද්දේ, *"ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රමවේදයට සම්බන්ධ වීම, එය ක්‍රියාත්මක කිරීම හෝ දිරිගැන්වීම වේවා, එය අතිශයින්ම සදාචාර විරෝධී යැයි සලකනු ලබන අතර, කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම සඳහා කිසිදු මැදිහත්වීමකින් වළකින ලෙස සියලු වෛද්‍ය වෘත්තිකයන්ට උපදෙස් දෙනු ලැබේ"*[38] ය යන උපදෙස මෙන්ම, තවද *"ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ලබා දී ඇති නියමිත උපදෙස් පිළිපැදීමට අපොහොසත් වන ඕනෑම වෛද්‍ය වෘත්තිකයෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය"* යනුවෙනි.[39]

කෙසේ වෙතත්, මෙම චක්‍රලේඛයට ඇතැම් ගතානුගතික මුස්ලිම් කණ්ඩායම්වල[40] විරෝධය එල්ල වූ නමුත් එය ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණයක් ලෙස මුස්ලිම් කාන්තාවන් සහ මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියාකාරීන් විසින් පිළිගනු ලැබීය.[41] ශ්‍රී ලංකාවේ මෙම ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පිළිවෙත පවතින බවට පිළිගැනීමේ ප්‍රගතිශීලී පියවරක් වශයෙන් මෙකී චක්‍රලේඛනය හඳුන්වාදිය හැකිය.[42]

---

33 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පනත, 14 වන වගන්තිය.

34 ඉහත එම, ප්‍රනාන්දු, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම', සන්ඩේ ඔබ්සර්වර්.

35 ඉහත එම, කුට්ටිලන්, 'ස්ත්‍රී චර්මච්ඡේදනය', *Pulse.lk*.

36 ඉහත එම, සරූර්, *මන්නාරම් කාන්තා සංවර්ධන සම්මේලනයේ වාර්තාව*, පි. 13.

37 ඉහත එම, ප්‍රනාන්දු, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම', සන්ඩේ ඔබ්සර්වර්.

38 'කාන්තා චර්මඡේදනයට එරෙහි සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය දෝෂ සහිතය', ඩේලි එෆ්ටී, 2018 ජූලි 11 http://www.ft.lk/Healthcare/Health-Ministry-Circular-against-female-circumcision-comes-under-flack/45-658798

39 ඉහත එම

40 "ශ්‍රී ලංකා ඉස්ලාමීය මධ්‍යස්ථානය කාන්තා චර්මච්ඡේදනය තහනම් කිරීම අවමානයක් ලෙස හෙළා දකී", රොයිටර්, 2018, https://www.reuters.com/article/us-sri-lanka-women-fgm/sri-lankan-islamic-center-condemns-ban-on-femalecircumcision-as-affront-idUSKBN1K12OZ

41 ඒ. එච්. ෂෙරිෆ්ඩීන් සහ ආචාර්ය රුවයිස් හනීෆා 'පිළිතුරු දීමට ඇති අයිතිය: කාන්තා ප්‍රජනක අවයව විකෘති කිරීම', ඩේලි මිරර්, 2018 සැප්තැම්බර් 28, http://www.dailymirror.lk/article/Right-of-Reply-female-genital-mutilation-156101.html, කාන්තා චර්මච්ඡේදනයට ප්‍රතිචාරය: ඉස්ලාමීය භාවිතයක් මගින් කාන්තාවන්ට අප්‍රමාණ ප්‍රතිලාභ ගෙන එයි 2018 සැප්තැම්බර් 26 දින ඩේලි මිරර් හි ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රජනක අවයව විකෘති කිරීම තහනම් කරන්න. http://www.dailymirror.lk/article/Response-to-Female-Circumcision-An-Islamic-practice-brings-untold-benefits-to-women-Ban-FGM-in-Sri-Lanka-155992.html

42 ඉහත එම, ඊබ්‍රාහිම් සහ ටෙගල්, ශ්‍රී ලංකාවේ කාන්තා ලිංගේන්ද්‍රිය ඡේදනය පිළිබඳව අවබෝධ කර ගැනීම, පි. 8.

කෙසේ වෙතත්, දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානයන්හි සාමාන්‍ය භාවිතය මෙකී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට අදාල ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී ප්‍රමාණවත් නොවන බව සනාථ විය හැකිය. එපමණක් නොව, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ ඉහත කී ක්‍රියා පටිපාටිය සිදුකරන කිසිදු වෛද්‍ය පුහුණුවක් නොලත් *'ඔස්ටි මාමි'* යනු සෞඛ්‍ය අමාත්‍යාංශය[43] විසින් නිකුත් කරන ලද පෙරකී චක්‍රලේඛයෙන් පරිබාහිර පුද්ගලයෙකු වන අතර, අදාල චක්‍රලේඛනය වෛද්‍ය වෘත්තිකයන් විසින් සිදු කරනු ලබන ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් හා බැඳි ක්‍රියා පටිපාටිවලට පමණක් සීමා වේ. එබැවින්, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් වලට අදාල පරිචයෙහි සුවිශේෂතා පිළිබඳව අවධානය යොමු කොට අදාල ගැටළු විසඳීම සඳහා ඵලදායී නෛතික හා ආයතනික ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය ඉස්මතු වේ.

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් සම්බන්ධ පරිචය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය යටතේ සහතික කර ඇති සමානාත්මතාවයට හා වෙනස් කොට සැලකීමට භාජනය නොවීම සඳහා ඇති අයිතිවාසිකම උල්ලංඝනය කිරීමකි. වර්ෂ 1981 සහ 1990 දී පිළිවෙලින් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය (Elimination of All Forms of Discrimination against Women-CEDAW) සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (Convention on Rights of the Child-CRC) ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර ඇති අතර, එකී සම්මුතීන්හි විධිවිධාන සම්බන්ධයෙන් වන මෙරට තත්වය ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ කමිටු විසින් වරින් වර සමාලෝචනයට භාජනය කරනු ලැබේ. මෙවන් වූ අන්තර්ජාතික සම්මුතීන් හා ඇති බැඳීම්වලට අනුකූල වීම සඳහා රාජ්‍යයන් තුළ සිටින පුද්ගලයින් හෝ ප්‍රජාවන් නොව අදාල රාජ්‍ය පාර්ශවයන් සතු වගකීමකි.[44] නිදසුනක් වශයෙන්, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතයෙහි 2(ඊ)[45] වගන්තිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතයෙහි 24(3)[46] වගන්තිය මඟින් කාන්තාවන්ට වෙනස් කොට සැලකීම සහ දරුවන්ගේ සෞඛ්‍යයට අගතියක් වන සිරිත් විරිත් හා සම්ප්‍රදායන් වෙනස් කිරීම හෝ අහෝසි කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන්ට බැඳී සිටින බව පෙන්වා දේ. ඒ අනුව, මානව හිමිකම් සඳහා වන කැපවීම තහවුරු කිරීම සඳහා නීති සම්පාදනය සහ ප්‍රතිපත්ති හඳුන්වා දීම සහ බලාත්මක කිරීම රජ්‍ය පාර්ශවයට පැවරී ඇත.

වර්ෂ 2012 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සුවිශේෂී යෝජනාවක් ඒකමතිකව සම්මත කර ගත් අතර එමඟින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් සම්බන්ධ පරිචය අවසන් කිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීමේ උත්සාහයන් තීව්‍ර කරන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඉල්ලා සිටියේය.[47] වර්ෂ 2015 දී ගෝලීය ප්‍රජාව 'තිරසාර සංවර්ධන ඉලක්ක' මාලාවක් සඳහා එකඟ වූ අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් ද ඇතුළු සියලු හානිකර ක්‍රියාකාරකම් තුරන් කිරීම හා සම්බන්ධව 5 වන ඉලක්කය යටතේ තවදුරටත් එකඟ විය.[48] එවක පටන් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ව්‍යවස්ථාපිත හා ආයතනික රාමුවක් ස්ථාපිත කර තිබේ.[49]

---

[43] වර්ෂ 1927 අංක 26 දරණ වෛද්‍ය වෘත්තිකයන්, ඖෂධවේදීන්, වින්නඹු මාතාවන් සහ හෙද ආඥා පනතෙහි 34 වන වගන්තිය බලන්න.

[44] අනිකා රහ්මාන් සහ නහීඩ් ටූබියා, ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීම: ලොව පුරා නීති සහ ප්‍රතිපත්ති සඳහා මාර්ගෝපදේශයක්, ලන්ඩන්: සෙඩ් බුක්ස්, 2000, පි. 44.

[45] රාජ්‍ය පාර්ශවයන් "කාන්තාවන්ට වෙනස් කොට සැලකීම ඇතුළත් පවත්නා නීති, රෙගුලාසි, සිරිත් විරිත් සහ භාවිතයන් වෙනස් කිරීම හෝ අහෝසි කිරීම සඳහා නීති සම්පාදනය ඇතුළු සියලු සුදුසු පියවර ගැනීමට කටයුතු කරයි.

[46] රාජ්‍ය පාර්ශවයන් "දරුවන්ගේ සෞඛ්‍යයට අගතියක් වන සාම්ප්‍රදායික පිළිවෙත් අහෝසි කිරීමේ අරමුණින් සියලු ඵලදායී හා සුදුසු පියවර ගැනීමට" කටයුතු කරයි.

[47] එක්සත් ජාතීන්ගේ කාන්තාවන්, 'එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම තහනම් කරයි', 2012 https://www.unwomen.org/en/news/stories/2012/12/united-nations-bans-female-genital-mutilation

[48] එක්සත් ජාතීන්ගේ සංවිධානය, 'ඉලක්කය 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම, https://www.un.org/sustainabledevelopment/gender-equality/

[49] තිරසාර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය, 'තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ ස්වේච්ඡා ජාතික සමාලෝචනය', 2018 ජුනි https://sustainabledevelopment.un.org/content/documents/19677FINAL_SriLankaVNR_Report_30Jun2018.pdf

එබැවින්, ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද දේශීය හා ජාත්‍යන්තර අයිතිවාසිකම් පිළිබඳ බැඳීම් පිළිගැනීමේ පිළිබිඹුවක් වශයෙන්, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් දඬුවම් ලැබිය හැකි වරදක්[50] වශයෙන් සවිස්තරාත්මකව විස්තර කරමින් ඒ සඳහා නව නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

## විවිධ කලාපයන්හි ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ තුලනාත්මක නීති තත්වයන්

ලොව පුරා බොහෝ රටවලට ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් පිළිබඳ නිශ්චිත නීති පවතී. මෙම රටවල් ද වර්තමානයෙහි වැඩි වැඩියෙන් පෙළඹෙන්නේ මෙකී වරදට සාර්ථකව අභියෝදනා ගොනු කර නඩු පැවරීමට ය. වාර්තාවෙහි මෙම කොටස මඟින් එවන් බලතල පවතින රටවල් කීපයක් සම්බන්ධයෙන් සහ ඒවායේ නීතිමය සැකසුම් විස්තරාත්මකව විමසා බලනු ලබයි.

## එක්සත් රාජධානිය

එක්සත් රාජධානිය තුළ ඊටම සුවිශේෂී වූ නීතිමය ප්‍රතිපාදන මඟින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නීති විරෝධී ක්‍රියාවක් බවට පත්කර ඇත. වර්ෂ 1985 ස්ත්‍රී චර්මච්ඡේදනය තහනම් කිරීමේ පනත (Prohibition of Female Circumcision Act) හඳුන්වා දුන් දින සිට ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සාපරාධී වරදකි.[51] වර්තමානයේ, 2003 ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පනත (Female Genital Mutilation Act) යටතේ මෙම ක්‍රියාව තහනම් කර ඇත.[52] වර්ෂ 2015 ඇතිකල බරපතල අපරාධ පනත[53] මඟින් පසුව ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පනත සංශෝධනය කළ අතර ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සඳහා භෞමික වශයෙන් අධිකරණ බලය දීර්ඝ කිරීම සඳහා නව විධිවිධාන ඇතුළත් කරන ලදි. මෙකී පනත මඟින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාවෙහි වින්දිතයින්ගේ නිර්නාමිකභාවය, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට පාත්‍ර වීමෙන් ගැහැණු ළමයෙකු ආරක්ෂා කිරීමට අපොහොසත් වීම සහ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට අදාල ආරක්ෂණ නියෝග පිළිපැදීමට අපොහොසත් වීම නව වරදක් වශයෙන් හඳුන්වා දීම, සහ වයස අවුරුදු 18 ට අඩු ගැහැණු ළමයින් සම්බන්ධයෙන් සිදුවී ඇති ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳව සෞඛ්‍ය සේවා වෘත්තිකයන් දැනුවත් සිද්ධීන් පොලිසිය වෙත වාර්තා කිරීම අනිවාර්ය රාජකාරියක් බව විධිවිධාන සැලසීම ආදිය ඇතුළත් කරන ලදි.[54]

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පනතෙහි 1(1) වගන්තිය මඟින් 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම' පිළිබඳ වරද විස්තර කර ඇත්තේ *"ගැහැණු ළමයෙකුගේ බාහිර යෝනි තොල්, අභ්‍යන්තර යෝනි තොල් හෝ භගමණිය සම්පූර්ණයෙන්ම හෝ ඒවායෙහි කොටසක් ඉවත් කිරීම හෝ විකෘති කිරීමේ ක්‍රියාව යම් තැනැත්තෙකු විසින් සිදු කරයි නම් එකී තැනැත්තා වරදක් කරන්නේය" යනුවෙන් පෙන්වා දී තිබේ.*[55]

ඉහත කී නිර්වචනය තුළ "පුද්ගලයෙකු" යන වාක්‍ය ඛණ්ඩය ඇතුළත් වීම සැලකිය යුතු කරුණක් වන්නේ එකී පනතෙහි විධිවිධාන වෛද්‍ය වෘත්තිකයන් විසින් සිදු කරනු ලබන ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියා පටිපාටි වලට පමණක් එකී නීති තත්වය සීමා නොවන බව ව්‍යංගාර්ථයෙන් පෙන්වා දෙනු ලබන හෙයිනි. මෙකී වරද සම්බන්ධයෙන් පවතින ව්‍යතිරේකයන් අතර ශාරීරික හා මානසික සෞඛ්‍යය හේතුන්

---

50 ඉහත එම, ඊබ්‍රාහිම් සහ ටීගල්, 'ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම', *අල් ජසීරා.*
51 1985 කාන්තා චර්මච්ඡේදනය කිරීමේ පනත, ලබා ගත හැක්කේ:
http://www.legislation.gov.uk/ukpga/1985/38/pdfs/ukpga_19850038_en.pdf
52 2003 ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පනත, http://www.legislation.gov.uk/ukpga/2003/31/contents
53 2015 බරපතල අපරාධ පනතේ 70 වන වගන්තිය මඟින් සංශෝධනය කරන ලද,
http://www.legislation.gov.uk/ukpga/2015/9/part/5/crossheading/female-genital-mutilation/enacted
54 බරපතල අපරාධ පනත 2015. 70-75 වගන්ති
55 ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පනත, 1 (1) වගන්තිය
http://www.legislation.gov.uk/ukpga/2003/31/section/1

මත සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා පටිපාටි; හෝ ලියාපදිංචි වෛද්‍යවරයකු, වින්නඹු මාතාවක හෝ වෛද්‍ය වෘත්තිකයෙකු හෝ වින්නඹු මාතාවක වීමට පුහුණුව ලබන පුද්ගලයෙකු විසින් දරු ප්‍රසූතිය හෝ දරු උපත් හා සම්බන්ධ අරමුණු සඳහා ආදී තත්වයන් පෙන්වා දී තිබේ.[56] ගැහැණු ළමයෙකුගේ මානසික සෞඛ්‍යය සඳහා ශල්‍යකර්මයක් අවශ්‍යද යන්න තීරණය කිරීමේදී, *"සැත්කම චාරිත්‍රයක් හෝ පිළිවෙතක් වශයෙන් අවශ්‍ය යැයි ඇය හෝ වෙනත් පුද්ගලයෙකු විශ්වාස කරන්නේද යන්න වැදගත් නොවේ."*[57] ගැහැණු ළමයෙකුට තමා විසින්ම ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කර ගැනීමට සහාය වීම නීති විරෝධී යැයි සැලකේ.[58]

එක්සත් රාජධානියේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සඳහා වන දඬුවම සිර දඬුවමක්, දඩයක් හෝ ඒ දෙආකාරයෙන්ම විය හැකිය.[59] වර්ෂ 1985 ස්ත්‍රී චර්මච්ඡේදනය තහනම් කිරීමේ පනත යටතේ, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සිදු කිරීම සඳහා උපරිම දඬුවම වසර පහකි. එංගලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තය සඳහා වර්ෂ 2003 ස්ත්‍රී චර්මච්ඡේදනය තහනම් කිරීමේ පනත යටතේ මෙකී දණ්ඩනය වසර 14 දක්වා දීර්ඝ කර ඇත.[60]

වර්ෂ 2003 බරපතල අපරාධ පනතට නව හඳුන්වාදීමක් වශයෙන් 2 වන උපලේඛනය අන්තර්ගත කල අතර එමගින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට මුහුණපෑ වින්දිතයින් සහ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට පාත්‍ර වීමේ අවදානමට ලක්වූවන් ආරක්ෂා කිරීම සඳහා ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ ආරක්ෂණ නියෝග සම්බන්ධයෙන් විධිවිධාන සපයයි.[61] එවන් වූ ආරක්ෂණ නියෝගයක් තුළ තහනම් කිරීම්, සීමා කිරීම්, අවශ්‍යතා සහ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට පාත්‍ර වීමේ අවදානමක් ඇති තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා අධිකරණය සුදුසු යැයි සලකන වෙනත් නියමයන් අඩංගු විය හැකිය. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට පාත්‍ර වීමේ අවදානමක් ඇති තැනැත්තෙක්, පළාත් පාලන ආයතනයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට අධිකරණයෙහි අවසරය ඇතිව ආරක්ෂණ නියෝගයක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර, එවන් නියෝගයක නියමයන් එක්සත් රාජධානියෙන් පිටත ගැටළුවක් වුවද ආමන්ත්‍රණය කළ හැකි තරම් පුළුල් පරාසයක් ආවරණය කෙරේ.[62] ආරක්ෂණ නියෝගයක් උල්ලංඝනය කිරීම යනු අධිචෝදනා ගොනු කරනු ලැබිය හැකි සාපරාධී වරදක් වන අතර ඒ සඳහා වරදකරුවෙකු වන තැනැත්තෙකුට වසර පහක සිර දඬුවමක්, දඩයක් හෝ ඒ දෙආකාරයෙන්ම දඬුවම් ලබාදිය හැකිය.

වර්ෂ 1985 සිට එක්සත් රාජධානිය තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් පුළුල් නීති තිබුණද, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වන පළමු සාර්ථක නඩු පැවරීම සිදුවූයේ වර්ෂ 2019 දී පමණි.[63] ආර් එදිරිව එන් *(ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම)*[64] නඩුකරයේ දී වයස අවුරුදු තුනක් වූ තම දියණියගේ ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් මවක් වැරදිකරු වී වසර 13 ක සිර දඬුවමක් නියම විය. ළමා අපයෝජන සිදුවන එක් ක්‍රමවේදයක් ලෙස ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම එක්තරා අන්දමක ළමා අපයෝජනයක් වශයෙන් එක්සත් රාජධානියේ නීතියට පටහැනි වරදක් බවට දිගු කලක් පුරාවට පවතින බවත්, එමගින් ශාරීරික ප්‍රතිවිපාකවලට අමතරව, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම හේතුවෙන් සිදුවන මානසික බලපෑම් වින්දිතයාට දීර්ඝ කාලීනව අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති බවත්

---

56 ඉහත එම, 1(2) සහ 1(3) වගන්ති.

57 ඉහත එම, 1 (5) වගන්තිය.

58 ඉහත එම, 2 වගන්තිය.

59 ඉහත එම, 5 (1) (අ) සහ (ආ) වගන්තිය.

60 ඉහත එම, 5 වගන්තිය.

61 බරපතල අපරාධ පනත, 73 වන වගන්තිය.

62 ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පනත, 4 වන වගන්තිය

63 'FGM: දියණියගේ ලිංගික විකෘතිතාවයට මව වැරදිකරු', බීබීසී, 2019 පෙබරවාරි 1 https://www.bbc.com/news/uk-england-47094707

64 *R v N (ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම), ලබා ගත හැක්කේ:* https://www.judiciary.uk/wp-content/uploads/2019/03/r-v-nfemale-genital-mutilation-sentencing-remarks-whipple-j.pdf

අධිකරණය ප්‍රකාශ කරන ලදි.[65] මෙම සුවිශේෂී නඩුව ලොව පුරා ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට එරෙහිව හඬ නගන ක්‍රියාකාරීන් විසින් ඒ සම්බන්ධයෙන් වූ සාධනීය පියවරක් වශයෙන් පිළිගනු ලැබීය.[66]

මෙකී අපරාධනීය ක්‍රියාව සම්බන්ධයෙන් දණ්ඩන නියම කිරීම් සීමිත සංඛ්‍යාවක් පමණක් පැවතීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ඒ සම්බන්ධයෙන් යමෙකු වරදකරුවෙකු කිරීම සඳහා අවශ්‍ය කරන්නා වූ ප්‍රමාණවත් සාක්ෂි ලබා ගැනීමේ දී අදාල විමර්ශකයින් සහ අභිචෝදනා ගොනු කරන්නන් විසින් මුහුණ දෙන දුෂ්කරතාවයයි. බොහෝ ගැහැණු ළමයින් ස්වකීය දෙමාපියන්ට එරෙහිව නඩු පැවරීමට අකමැති බැවින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වාර්තා කිරීමට මැලිකමක් දක්වති.[67] එපමණක් නොව, ජාතිවාදය හා සංස්කෘතික පිළිවෙත් වලට අගෞරව කිරීම සම්බන්ධයෙන් චෝදනා ලැබීමට ඇති බිය හේතුවෙන් සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සහ ගුරුවරුන් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වන සිදුවීම් පිළිබඳව වාර්තා කිරීමට මැලිකමක් දක්වන බව නවතම වාර්තාවකින් හෙළි විය.[68] මෙකී සාක්ෂිකරුවන් බොහෝ විට පවුලේ අය හෝ මිතුරන් වන බැවින් ඔවුන් ඉදිරියට පැමිණීම පහසුවෙන් සිදුනොවන තත්වයක් ඇති අතර ඔවුන් එම පරිචය අනුමත කරනු ලබන ප්‍රජාවක කොටසක් වන අතර ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචයට යටත් වීම ප්‍රතික්ෂේප කරනු ලබන ප්‍රජාවෙන් නෙරපීමට ලක්වීමේ හැකියාවද පැවතිය හැකිය.[69] එබැවින්, අදාල විෂය කරුණ සම්බන්ධයෙන් පමණක් වන නීති මගින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ගැටළුව මුලිනුපුටා දැමීම කළ නොහැකි අතර පරිචය තුරන් කිරීමට නම් එකී නීතීන් ක්‍රියාත්මක කිරීමට සහ නඩු පැවරීමට සහාය වීම සඳහා ගත යුතු අනෙකුත් ක්‍රියාමාර්ග ගණනාවක සහය අවශ්‍ය වේ.

## ඉන්දියාව

ඉන්දියාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් පවතින තත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා නීති හඳුන්වා දී නොමැත. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව ඉන්දියාව තුළ හඳුන්වනු ලබන්නේ *'ඛට්නා'* හෝ *'කෆ්ස්'* ලෙස හඳුන්වනු ලබන අතර එය බෝරා ප්‍රජාව අතර බහුලව දක්නට ලැබේ.[70] ශ්‍රී ලංකාවෙහි තත්වයට සමානව, ඉන්දියාව තුල ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව රහසිගතව සිදුවන බැවින් එහි ව්‍යාප්තියේ ශීඝ්‍රතාවය අවබෝධ කරගත නොහැක. අතීතයේ දී, ඉන්දියානු රජය විසින් පෙන්වාදෙන ලද්දේ එරට තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පවතින බව පෙන්වීමට නිල සංඛ්‍යා ලේඛන නොමැති බවයි.[71] මෙම ක්‍රියා පටිපාටිය සාමාන්‍යයෙන් වෛද්‍ය පුහුණුව නොලත් වින්නඹු මාතාවන් සහ ප්‍රජාවේ වැඩිහිටි කාන්තාවන් විසින් සිදු කරනු ලැබේ.[72]

---

65 ඉහත එම

66 'තුන් හැවිරිදි මව එක්සත් රාජධානියේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් වරදකරු වූ පළමු පුද්ගලයා', ගාඩියන් 2019 පෙබරවාරි 1 https://www.theguardian.com/society/2019/feb/01/fgm-mother-of-three-year-old-first-person-convicted-in-uk

67 ලූසි මිල්බර්න්, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම් වලට එරෙහි එක්සත් රාජධානියේ නීතිය ක්‍රියාත්මක නොවන්නේ ඇයි?', නිවැරදි තොරතුරු, https://rightsinfo.org/why-uk-laws-fgm-not-working/

68 ඇනා ඩේවිස්, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම්ගැන අනතුරු ඇඟවීමට තවමත් වෛද්‍යවරු, හෙදියන් සහ ගුරුවරුන් බියයි', ඊව්නින් ස්ටෑන්ඩර්ඩ්, 2018 අප්‍රේල් 27, https://www.standard.co.uk/news/health/doctors-nurses-and-teachers-still-fear-raising-alarm-overfgm-a3825156.html

69 උතුරු අයර්ලන්ත මානව හිමිකම් කොමිසම, 'එක්සත් රාජධානියේ කාන්තා ලිංගික විකෘතිය', 2016 අගෝස්තු https://www.nihrc.org/uploads/publications/FGMinUK-15.08.2016.pdf

70 ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්, 'ඉන්දියාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම' https://amnesty.org.in/female-genitalmutilation-in-india/

71 රීනා චන්ද්‍රන්, 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ කිසිදු සාක්ෂියක් නැත, ඉන්දියානු රජය උසාවියට කියයි, ක්‍රියාකාරීන් බිය ගන්වයි', රොයිටර්, 2017 දෙසැම්බර් 29 https://www.reuters.com/article/us-india-women-religion/no-evidence-of-fgm-india-government-tellscourt-appalling-activists-idUSKBN1EN0QB

72 සෝමියා ඇබ්‍රෝල්, 'ඔව්, ඉන්දියාවේ කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම සිදුවන්නේ යඃ ඔබ දැනගත යුතු සියල්ල මෙහි ඇත', ඉන්දියා ටුඩේ, 2018 පෙබරවාරි 6 https://www.indiatoday.in/lifestyle/people/story/female-genital-mutilation-indiaclitoris-pleasure-muslim-bohra-community-1162510-2018-02-06

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම තහනම් කරන ලෙස ඉල්ලා වර්ෂ 2017 මැයි මාසයේදී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයේ මහජන නඩුකරයක් ගොනු කරන ලදි.[73] මෙකී පෙත්සම[74] මගින් ඉදිරිපත් කරන ලද්දේ දාවුඩි බෝරා ප්‍රජාවේ ගැහැණු ළමයින් සඳහා කරන ලද ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සම්බන්ධයෙන් කිසිදු සඳහනක් අල් කුරාණයෙහි නොමැති අතර එය වෛද්‍ය හේතුවක් නොමැතිව සිදුකරන බවයි.[75] මෙම ක්‍රියාව මගින් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන වගන්තිය, එනම් නීතිය ඉදිරියේ සමානාත්මතාවයට ඇති අයිතිය සහ 21 වන වගන්තිය මගින් පෙන්වා දෙනු ලබන ජීවත්වීමේ අයිතිය සහ පුද්ගලික නිදහස උල්ලංඝනය කර ඇති බව එකී පෙත්සම මගින් තවදුරටත් පෙන්වාදෙන ලදි. මෙම නඩුවේ ගොනු කර ඇති මැදිහත්වීමේ පාර්ශවකාර පෙත්සම් කිහිපයක්ම අදාල ක්‍රියාව තහනම් කිරීම සම්බන්ධයෙන් සහය දැක්වීම හෝ එය ඩාවුඩි බෝරා ප්‍රජාවට වැදගත් ආගමික පිළිවෙතක් යන පදනම මත එකී පරිචය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද කරුණු ඉදිරිපත් කරන ලදි.[76] වර්ෂ 2018 ජූලි මාසයේ පැවති නඩු විභාගයෙහි දී, ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක්, *"කාන්තාවන්ගේ ශාරීරික සුපිළිපන්නතාව"* උල්ලංඝනය කළ නොහැකි බව නිරීක්ෂණය කරන ලදි. කෙසේ වෙතත්, වර්ෂ 2018 සැප්තැම්බර් මාසයේදී මෙම නඩුව විනිසුරුවන් පස් දෙනෙකුගෙන් යුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විනිසුරු මඩුල්ලක්[77] වෙත යොමු කරන ලදි. නඩු විභාගය අතරතුර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පුද්ගලයෙකුට තවත් තැනැත්තෙකුට තුවාල කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා නොදෙන බව අගවිනිසුරුවරයා විසින් වාචිකව නිරීක්ෂණය කරන ලද අතර විනිසුරු චන්ද්‍රාචූඩ් තවදුරටත් නිරීක්ෂණය කරන ලද්දේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව හේතුවෙන් තරුණ ගැහැණු ළමයින්ට ස්ථිරව පවතින පරිදි, හැඟීම් වලට සහ මානසිකව කැළලක් ඇති කරන බවයි.[78]

වර්ෂ 2019 දී කේරළයේ සබරිමාල කෝවිල සම්බන්ධ නඩුවේ සමාලෝචන පෙත්සම් විභාගයේදී මෙම ඉහත කී නඩුව සම්බන්ධයෙන් යොමු කරන ලදි.[79] ඩාවුඩි බෝරා ප්‍රජාව තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය ද ඇතුළුව, ස්ත්‍රී පුරුෂ භාවය සහ ආගමික අයිතිවාසිකම් පිළිබඳව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු සමඟ කාන්තාවන්ට කෝවිලට ඇතුළුවීම සම්බන්ධයෙන් පවතින විවාදය එකිනෙක හා බැඳී පවතින තත්වයක් බවට ශ්‍රේෂ්ඨාධිකරණයේ පස් දෙනෙකුගෙන් යුත් විනිසුරු මඩුල්ලක් විසින් තීන්දු කරන ලදි.[80] විවිධ ජන කොටස්වලට අදාල නඩු සම්බන්ධයෙන් අධිකරණ තීන්දුවක් දීමට පෙර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමික නිදහසට ඇති මූලික අයිතිය පාලනය වන මූලධර්ම අර්ථ නිරූපණය කිරීම පුළුල් විනිසුරු මඩුල්ල විසින් මුලින්ම සිදුකළ යුතු බව අධිකරණය විසින් ප්‍රකාශ ප්‍රකාශ කරන ලදි.[81] මෙකී නඩුව විභාග කිරීම කිහිප වතාවක්ම ප්‍රමාද වී ඇති අතර වර්ෂ 2020 නොවැම්බර් වන විට ද නඩුව විභාග කිරීම අවසන් කර නොමැත.

---

73 *සුනීතා තිවාරි එදිරිව ඉන්දියානු සංගමය* [රිට් පෙත්සම (සිවිල්) 2017 අංක 286]

74 පෙත්සම https://scobserverproduction.s3.amazonaws.com/uploads/case_document/document_upload/411/FGM.pdf

75 ඉහත එම

76 'ඉන්දියාවේ කාන්තා ලිංගික අවයව කැපීම ගැන සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නවතම තීන්දුව අවබෝධ කර ගැනීම', සහියෝ, https://sahiyo.com/2019/11/17/understanding-the-supreme-courts-latest-judgement-mentioning-femalegenital-cutting-in-india/

77 ක්‍රිෂ්ණදාස් රාජගෝපාල්, 'ශ්‍රේෂ්ඨාධිකරණය 'ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට එරෙහි ආයාචනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට යොමු කරයි', ද හින්දු, 2018 සැප්තැම්බර් 24, https://www.thehindu.com/news/national/sc-refers-pil-against-female-genitalmutilation-to-constitution-bench/article25026340.ece

78 ඉහත එම

79 'සබරිමාල සමාලෝචනයේ සඳහන් තවත් අවස්ථා තුනක්', සජීවී නීතිය, 2019 නොවැම්බර් 15 https://www.livelaw.in/top-stories/three-other-cases-mentioned-in-sabarimala-review-order-149785

80 'ශ්‍රේෂ්ඨාධිකරණය සබරිමාල කෝවිල ප්‍රශ්නය විශාල විනිසුරු මඩුල්ලකට යොමු කරයි, කාන්තාවන්ට ඇතුළුවීමට ඉඩ නොදේ', ඉන්දියා ටුඩේ, 2019 නොවැම්බර් 14, https://www.indiatoday.in/india/story/sabarimala-verdict-supreme-court-refers-case-to-7judge-bench-1618772-2019-11-14

81 'ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීමේ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ විභාග වෙමින් පවතී', හින්දුස්ථාන් ටයිම්ස්, 2019 නොවැම්බර් 15, https://www.hindustantimes.com/india-news/female-genital-mutilation-petition-pending-before-supremecourt/story-rsHGOLu0z5eEg3aZjHYEIL.html තවදුරටත් බලන්න: Samanwaya Rautray, 'ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හත් දෙනෙකුගෙන් යුත් විනිසුරු මඩුල්ලට සබරිමාල නඩුව යොමු කරයි, කාන්තාවන්ට ඇතුළුවීම තහනම්', ඉකොනොමික්ස් ටයිම්ස්, 2019 නොවැම්බර් 14, https://economictimes.indiatimes.com/news/politics-and-nation/sc-refers-sabarimala-case-to-a-larger-sevenjudge-bench/articleshow/72049884.cms

## වෙනත් රටවල අධිකරණ බලයන් පිළිබඳ තත්වය

ඕස්ට්‍රේලියාවේ, සියලුම ප්‍රාන්ත සහ අනෙකුත් බලප්‍රදේශයන්හි ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව තහනම් කරමින් අපරාධ නීති සම්මත කර ඇත.[82] ඕස්ට්‍රේලියානු මහාධිකරණය විසින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සම්බන්ධයෙන් ප්‍රථම වරට වර්ෂ 2019 දී නඩු පැවරූ අතර එහිදී තිදෙනෙකු වැරදිකරුවන් වූ අතර එම ක්‍රියාව සියලු ආකාරවලින් තහනම් කර ඇති බව නැවත තහවුරු කළේය.[83]

එක්සත් ජනපදයේ, වර්ෂ 1996 දී කොන්ග්‍රසය ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව අපරාධයක් බවට සංස්ථාපනය කරමින් නීති පැනවීය.[84] මෙම නීතිය යටතේ වසර 21 කට පමණ පසු වර්ෂ 2017 දී පළමු වරට වෛද්‍යවරයකුට එරෙහිව චෝදනා ඉදිරිපත් කරන ලදි.[85] අධිකරණ දෙපාර්තමේන්තුව විසින්, විවාදයට හා විවේචනයට ලක් වෙමින්, මෙම නඩුව නිෂ්ප්‍රභා කරමින් ප්‍රකාශ කරන ලද්දේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් ෆෙඩරල් නීතියක්[86] සම්මත කිරීමට කොංග්‍රසයට බලයක් නොමැති බවය[87] මේ වන විට "ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නතර කිරීම" සඳහා වන පනත් කෙටුම්පත[88] නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙහි ඡන්ද විමසීම සඳහා යැවීමට පෙර අදාල අනුමැතිය සඳහා මණ්ඩළ අධිකරණ කමිටුව හමුවේ පවතී.[89] වර්ෂ 2020 වන විට, ෆෙඩරල් ප්‍රාන්ත 50 න් 38 ක්ම ස්වකීය නීති මඟින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම අපරාධයක් බවට සංස්ථාපනය කර ඇත.[90]

වර්ෂ 1979 සිට ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ[91] සිදුවීම් 50 ක් පමණ සම්බන්ධයෙන් වැරදිවලට එරෙහිව නඩු පැවරීම හේතුවෙන් එකී වරද සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන රාජ්‍යයන්ට ප්‍රමුඛ නිදසුනක් වශයෙන් ප්‍රංශය පෙන්වාදිය හැකිය.[92] කෙසේ වෙතත්, ප්‍රංශය තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට එරෙහිව නිශ්චිත සුවිශේෂී නීතියක් නොමැති අතර ඊට අදාල සිද්ධීන් සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ සාමාන්‍ය විධිවිධාන යටතේ, එනම් ශාරීරික හානි සිදු කිරීම, ස්ථිර දුබලතාවයකට පත්කිරීම හෝ විකෘති කිරීම ආදී වරදවල් යටතේ විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරනු ලැබේ.[93] තවද, අනතුරකට ලක්වූ

---

82 නීතිපති දෙපාර්තමේන්තුව, ඕස්ට්‍රේලියාවේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ නීති රාමුව සමාලෝචනය: අවසාන වාර්තාව, කැන්බරා: නීතිපති දෙපාර්තමේන්තුව, 2013, http://www.ag.gov.au/Publications/Pages/ReviewofAustraliasFemaleGenitalMutilationlegalframeworkFinalReportPublicationandforms.aspx

83 එලිසබෙත් බර්න්, 'මහාධිකරණය විසින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සෑම ආකාරයකින්ම නීති විරෝධී යැයි තීරණය කරයි, නිව් සවුත් වේල්ස් අධිකරණය වරදකරුවන් නිර්දෝශ කරයි', *ABC ප්‍රවෘත්ති,* 2019 ඔක්තෝබර් 16, https://www.abc.net.au/news/2019-10-16/high-court-rulesfemale-genital-mutilation-illegal-in-all-forms/11606396

84 18 එක්සත් ජනපද කේතය 116. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම https://www.law.cornell.edu/uscode/text/18/116

85 *එක්සත් ජනපදය එදිරිව. ජුමන නාගර්වාලා සහ වෙනත් අය,* අංක 7-cr-20274 (E.D. Mich. නොවැ. 20, 2018), https://www.justice.gov/oip/foia-library/osg-530d-letters/4_10_2019/download

86 ඉහත එම

87 කේට් රයන්, 'යූ.එස්. කාන්තා ලිංගික අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් රජය මගහරී', රොයිටර්, 2019 අප්‍රියෙල් 13, https://www.reuters.com/article/us-usa-womensrights-fgm/us-government-backs-off-case-of-female-genitalmutilation-idUSKCN1RO2LA. මෙයද බලන්න: 'එක්සත් ජනපදය පසුපසට ගමන් කරයි': ගැහැණු ලිංගික අවයව විකෘති කිරීම ගැහැණු ළමයින්ට අවදානමක් ඇති කරයි', ගාඩියන්, 2018 නොවැම්බර් 21, https://www.theguardian.com/law/2018/nov/20/us-femalegenital-mutilation-detroit-michigan-unconstitutional

88 H.R. 6100: 2020 ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නතර කිරීම පිළිබඳ පනත, https://www.govtrack.us/congress/bills/116/hr6100/text

89 සමානාත්මතාවය දැන්, 'එක්සත් ජනපදයේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම' https://www.equalitynow.org/fgm

90 AHA පදනම, 'රාජ්‍ය අනුව ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ නීති සම්පාදනය', https://www.theahafoundation.org/female-genitalmutilation/fgm-legislation-by-state/

91 කිම් විල්ෂර්, 'කාන්තා ලිංගික අවයව විකෘති කිරීම පිළිබඳ ප්‍රංශයේ දැඩි ස්ථාවරය ක්‍රියාත්මක වන බව උද්ඝෝෂකයින් විසින් පවසයි', ගාඩියන්, 2014 පෙබරවාරි 10 https://www.theguardian.com/society/2014/feb/10/france-tough-stance-female-genitalmutilation-fgm

92 Equipop Excision, parlons-en! සහ අවසන් කාන්තා ලිංගික අවයව විකෘති කිරීම පිළිබඳ යුරෝපීය ජාලය, ඒකාබද්ධ සෙවනැලි වාර්තාව - ප්‍රංශය (END FGM) https://rm.coe.int/equipop-excision-parlons-en-end-fgm-eu-joint-shadow-report-france/16807b41ab

93 හවුස් ඔෆ් කොමන්ස් ස්වදේශ කටයුතු කමිටුව, 'කාන්තා ලිංගික අවයව විකෘති කිරීම: ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සඳහා' 2014-15 සැසියේ දෙවන වාර්තාව https://publications.parliament.uk/pa/cm201415/cmselect/cmhaff/201/201.pdf

පුද්ගලයෙකු උපකාර කිරීම මඟ හැරීම හෝ එසේ කිරීමට අසමත් වීම අපරාධයක් වශයෙන් හඳුනාගනු ලබන අතර ඒ සඳහා විශාල දඩයක් හෝ සිර දඬුවමක් නියම විය හැකිය. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් යම් සිදුවීමක් වී ඇති අවස්ථාවන් පිළිබඳ පැමිණිල්ලට අවශ්‍ය සාක්ෂි ලබා ගැනීම සඳහා මෙම තත්වය ඵලදායී බව මෙමඟින් සනාථ කර ඇත.[94]

අන්තර්ජාතික වශයෙන් විවිධාකාර අධිකරණ බල ප්‍රදේශයන්හි ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් ඇතිවන ගැටළු ආමන්ත්‍රණය කරනු ලබන්නේ එකිනෙකට වෙනස් නීතිමය ප්‍රවේශයන් ද්විත්වයක් භාවිතා කරමිනිඃ එනම්, නිශ්චිත නීති හඳුන්වාදීම හෝ දැනටමත් ක්‍රියාත්මක වන පවතින පොදු විධිවිධාන භාවිතා කිරීම යන දෙආකාරයයි. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ උදාහරණයෙන් පැහැදිලි වන්නේ හුදෙක් එකී විෂය කාරණය සම්බන්ධයෙන් වෙනම පනතක් හඳුන්වාදීම මගින් පමණක් නීතිය බලාත්මක කිරීම සහතික කළ නොහැකි බවයි. තවද, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමේදී පවත්නා විධිවිධාන භාවිතය තුළින් පමණක් එකී අපරාධය තුරන් කිරීමේ අවසාන ඉලක්කය සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවන බව ද ඒ හා සමගාමීව විද්‍යමාන වේ. දෙවන ප්‍රවේශය සම්බන්ධයෙන් ගත් කල, එහිදී පවත්නා නීතිය තුළට ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් ඇතිවන ගැටළු අන්තර්ගත කිරීම සඳහා අධිකරණය විසින් පුළුල් අර්ථකථනයක් ලබාදීම යන තත්වය මත පදනම්ව කටයුතු කිරීමට සිදුවේ. ඉහතින් පෙන්වා දුන් සංසන්දනාත්මක විශ්ලේෂණයන්ට අනුව, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් ඇතිවන ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් තරම් පියවරයන් ගෙන නොමැති තත්වයන්හිදී, එකී පරිචය හෙවත් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව තහනම් කිරීම සහ මුලිනුපුටා දැමීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ද සහිතව ඊට අවැසි නව නීති සැකසීම අවශ්‍ය වේ.

[94] ජෝන් ලිච්ෆීල්ඩ්, 'ප්‍රංශ ක්‍රමයඃ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් සටන් කිරීමට වඩා හොඳ ප්‍රවේශයක්?', ස්වාධීන, 2013 දෙසැම්බර් 15
https://www.independent.co.uk/news/world/europe/the-french-way-a-better-approach-to-fighting-fgm9006369.html

# නිර්දේශ

ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව වූ කලී ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහිව සිදු කරනු ලබන වරදක් වශයෙන් පිළිගැනීමේ ගෝලීය ප්‍රවණතාවක් පවතී. තවත් අධිකරණ බල ප්‍රදේශ කිහිපයක බෝරා ප්‍රජාවෙහි නායකයින් විසින් නිකුත් කරන ලද ලිපි මගින් අවධාරණය කරනු ලැබ ඇත්තේ යම් ලෙසකින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව අදාල අධිකරණ බලයට අයත් කලාපයෙහි බලපැවැත්වෙන නීතියට පටහැනි නම්, එකී ක්‍රියාව ක්‍රියාත්මක නොකළ යුතු බවයි.[95] ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීමට සමගාමීව සුදුසු අපරාධ නීති සම්මත වුවහොත් එකී පරිචය ශ්‍රී ලංකාව තුළ භාවිත කිරීම නතර කිරීමට හේතු විය හැකිය. ඒ අනුව ක්‍රියා කටයුතු කරමින්, ශ්‍රී ලංකාව විසින් ප්‍රාදේශීය, කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ශක්තිමත් හා නිසි සම්බන්ධීකරණයකින් යුත් ප්‍රවේශයක් ඔස්සේ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය තවදුරටත් පවත්වාගෙන යෑම තහනම් කිරීමට අවැසි පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත්, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව මුළුමනින්ම තුරන් කිරීම සඳහා, එකී ක්‍රියා මඟින් බලපෑමට ලක්වූ ප්‍රජාවන්ගේ සහාය ද අත්‍යවශ්‍ය වේ. නීති සම්පාදනය සහ ප්‍රතිපත්තිය මගින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම හා බැඳි ගැටළු ආමන්ත්‍රණය කිරීම පවතින ප්‍රජා පාදක ප්‍රයත්නයන් සඳහා නෛතික සහ ප්‍රතිපත්තිමය විධිවිධානයන් සහ ව්‍යුහයන් මඟින් නිසි සහයෝගයක් ලැබිය යුතු අතර ඒ සම්බන්ධයෙන් වන පාර්ශවකරුවන්ගේ විවෘත සාකච්ඡාවට සහ සවිබල ගැන්වීමට පහසුකම් සැලසිය යුතුය. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව අපරාධයක් වශයෙන් සංස්ථාපනය කිරීම සඳහා නීති සම්පාදනය කිරීමට අමතරව, ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව හේතුවෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට මෙම භාවිතයේ සංස්කෘතික හා සමාජ මූලයන් අභියෝග කිරීමට අවස්ථාව ලබා දීම අත්‍යවශ්‍ය වේ. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව පිළිබඳ සාකච්ඡා හා දැනුවත් කිරීමේ වැඩසටහන් ද පැවැත්විය යුත්තේ ගෞරවනීය, පූර්ව නිගමනයන්හි සිට විනිශ්චය අදහස් නොදරමින් සහ පීතෘමූලික නොවන ආකාරයෙන් බව විධාරනය කල යුතුය.[96]

පහත සඳහන් නිර්දේශයන් ඔස්සේ මෙකී සියලු ප්‍රතිඵලයන් ළඟාකර ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

---

95 සරුර්, මන්නාරම් කාන්තා සංවර්ධන සම්මේලනයේ වාර්තාව, පි. 21.

96 ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ලිංගේන්ද්‍රිය ඡේදනය කිරීම අවබෝධ කර ගැනීම සඳහා ඊබ්‍රාහිම් සහ ටිගල්, පි. 41.

## නීති ප්‍රතිසංස්කරණ

- ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නම් වූ වරද නෛතිකමය ස්වරූපයකින් තහනම් කරන පුළුල් නීතියක් සම්පාදනය කලයුතු අතර ඊටඃ

    අ. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ පුළුල් අර්ථ දැක්වීමක් ඇතුළත් වීම.

    ආ. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සිදු කරනු ලබන වෛද්‍ය වෘත්තිකයින්ගේ සිට වෛද්‍ය විද්‍යාත්මක පුහුණුව නොලත් පුද්ගලයින් වන *'ඔස්ති මාමි'* වැනි කවර තැනැත්තෙකුගේ එවන් ක්‍රියාවක් වුවද අපරාධයක් වශයෙන් හඳුනා ගැනීම.

    ඇ. ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයන් විසින් වලංගු වෛද්‍ය හේතූන් මත සිදුකරන ශල්‍යකර්ම ද ඇතුළුව ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව සම්බන්ධයෙන් වන ව්‍යතිරේකයන්ගේ පරිපූර්ණ ලැයිස්තුවක් ඇතුළත් කිරීම.

    ඈ. කාන්තා ලිංගික අවයව සම්බන්ධයෙන් වෛද්‍ය විද්‍යාත්මකව අවශ්‍ය ක්‍රියා පටිපාටීන් සිදු කිරීමට බලය ඇති වෛද්‍ය වෘත්තිකයන් විශේෂ කොට පෙන්වාදීම.

    ඉ. ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාව හේතුවෙන් වින්දිතයින් වූ තැනැත්තන් මෙන්ම එකී ක්‍රියාවට පාත්‍ර වීමේ අවදානම ඇති තැනැත්තන් සඳහා ආරක්ෂණ නියෝග[97] ලබා දීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීම.

ආදී අංග ලක්ෂණ අන්තර්ගත වියයුතු වේ.

- ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නම් වූ වරද සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමට අදාල වරදකරුවන්ට දඬුවම් නියම කිරීම සම්බන්ධයෙන් විනිසුරුවන්ට අවශ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරීම.

    අ. මෙකී මාර්ගෝපදේශයන්හි වින්දිතයාගේ නිර්නාමිකභාවය තහවුරු කිරීම සඳහා සුදුසු පියවර ඇතුළත් කල යුතුය.

### ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

- කාන්තාවන්ට එරෙහි හිංසනය අර්ථ දැක්වීමේදී *'කාන්තා ප්‍රජනක අවයව විකෘති කිරීම සහ කාන්තාවන්ට හානිකර වෙනත් සාම්ප්‍රදායික පිළිවෙත්'* ඇතුළත් වන ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (2016-2020)[98] විසඳීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

- ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය වටා ඇති අපකීර්තියට පිළියම් යෙදීම සඳහා ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ ක්‍රියාවෙන් බලපෑමට ලක්වූ ප්‍රජාවන් තුළ මහජන සාකච්ඡා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ එමඟින්ඃ

---

[97] ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය පිළිබඳ පනතට සමාන වන අතර එක්සත් රාජධානියේ ක්‍රියාත්මක වේ.

[98] කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, 'ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (SGBV) විසඳීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2016-2020' ජූනි 2016, පි. 16, ලබා ගත හැකියඃ http://gbvforum.lk/rlibrary/document/SGBV%20National%20Action%20Plan.pdf

අ. සංස්කෘතිකමය වශයෙන් සංවේදී, පූර්ව නිගමන මත විනිශ්චය නොකරන සහ ආරක්ෂිත ආකාරයකින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම.

ආ. එවන් සංවාදයන් ප්‍රජා නියෝජිතයින් මෙන්ම සෞඛ්‍ය, සමාජ සුභසාධන, අධ්‍යාපන සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සමඟ සහයෝගයෙන් පවත්වනු ලැබීම.

ඇ. එවන් සංවාදයන් සඳහා සහභාගිවන්නන්ට අවබෝධ කරගැනීම උදෙසා ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ වෛද්‍යමය ප්‍රතිවිපාකයන් පිළිබඳ වෛද්‍ය විද්‍යාත්මකව තොරතුරු නිවැරදිව හා ප්‍රේක්ෂකයාට ග්‍රහණය කරගත හැකි ආකාරයකින් ලබා දීම.

- ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචයට එරෙහිව ක්‍රියා කිරීම උදෙසා ජාතික ළමා ආරක්ෂණ අධිකාරියෙහි කාර්යභාරය සහ ස්වාධීනත්වය තවදුරටත් ඉහළ නැංවීම.

- ලිංගික අධ්‍යාපනයට, අමතරව පාසල් විෂය මාලාවේ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයේ බලපෑම පිළිබඳව ඉගැන්වීමේ අංගයක් ලෙස ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීමේ පරිචය සම්බන්ධයෙන් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කල යුතුය.

- විශේෂයෙන් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නීතිමය වශයෙන් සාපරාධී ක්‍රියාවක් වශයෙන් සංස්ථාපනය කිරීමෙන් පසු ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම වැළැක්වීම සඳහා උද්ඝෝෂණය කරන පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ඒ සඳහා වැඩි සහයෝගයක් ලබාදීම සහ අරමුදල් සැපයීම.

- ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම නිවැරදිව හඳුනාගෙන සාර්ථකව නඩු පැවරීම සහතික කිරීම සඳහා වෛද්‍ය වෘත්තිකයන්, ප්‍රජා සෞඛ්‍ය සේවා සපයන්නන්, නීතිඥයින් සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් අතර ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳව අවබෝධය ඉහළ නැංවීම සහ දැනුවත් කිරීම.

- රට තුළ ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම පිළිබඳ සිදුවීම් සොයා ගැනීම සඳහා ශක්තිමත් අධීක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම.

- වින්දිතයින්ගේ නිර්නාමිකභාවය සහතික කරන අතරම මෙකී ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සිදුවීමේ තත්වය අධ්‍යයනය කිරීම පිණිස කාලානුරූපීව පර්යේෂණ දියත් කිරීම සහ අදාල සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම.